# පටිච්චසමුප්පාදය (හයවෙනි කොටස)
## 26.05. 2019 - ශ්‍රී ලංකාරාමය
## නවසීලන්තය

හොඳයි, මේ දවස්වල අපි කථා කරන්නේ පටිච්චසමුප්පාදයේ විඤ්ඤාණ පච්චයා නාමරූපං කියන තැන. ඊට ඉස්සෙල්ලා අපි පටිච්චසමුප්පාදය සජ්ඣායනා කරමු. පටිච්චසමුප්පාදය බොහොම ගාම්භීර ධර්මයක්. බුද්ධ සාසනයකින් තොරව බුදුරජාණන්වහන්සේ කෙනෙකුගේ පහළ වීමකින් තොරව වෙන කිසිම බාහිර සාසනයක හොයා ගන්න නැති විශේෂිත ගාම්භීර වූ ධර්ම කොට්ඨාසයක් ධර්ම විග්‍රයක් තමයි පටිච්චසමුප්පාදය කියලා කියන්නේ. බුදුසසුනක විතරයි මේක හම්බවෙන්නේ. බුදුරජාණන්වහන්සේ නමක් පමණයි මේක දේශනා කරන්නේ. බුදුරජාණන්වහන්සේගෙන් අහලා ශ්‍රාවකයෝ දේශනා කරනවා අවබෝධ කරගන්නවා ඇරෙන්න වෙන කිසිම කෙනෙක් මේකට එන්නේ නෑ. ඉතාම ගාම්භීර ධර්මයක් තමයි මේ අපි කථා කරන්න යන්නේ. ඒ නිසා ඒ කොටස අපි දැන් සජ්ඣායනා කරමු.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙව දුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො, සඞ්ඛාර නිරොධා විඤ්ඤාණ නිරොධො, විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො, නාමරූපනිරොධා සළායතනනිරොධො, සළායතනනිරොධා ඵස්සනිරොධො, ඵස්සනිරොධා වෙදනානිරොධො, වෙදනානිරොධා තණ්හානිරොධො, තණ්හානිරොධා උපාදානනිරොධො, උපාදානනිරොධා භවනිරොධො, භවනිරොධා ජාතිනිරොධො, ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙව දුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

අනෙකජාතිසංසාරං, සන්ධාවිස්සං අනිබ්බිසං;
ගහකාරකං ගවෙසන්තො, දුක්ඛා ජාති පුනප්පුනං.
ගහකාරක දිට්ඨොසි, පුන ගෙහං න කාහසි;
සබ්බා තෙ ඵාසුකා භග්ගා, ගහකූටං විසංඛිතං
විසංඛාරගතං චිත්තං, තණ්හානං ඛයමජ්ඣගා.

පටිච්චසමුප්පාදය සජ්ඣායනා කරන්නත් ඉගෙන ගන්න ඕනෑ. ඒකෙ දුක්ඛක්ඛන්ධය ඇතිවීමේ ක්‍රමයකුත් තිබෙනවා. දුක්ඛක්ඛන්ධය නැතිවීමේ ක්‍රමයකුත් තිබෙනවා.

දුක්ඛක්ඛන්ධය ඇති වෙන විදියයි දුක්ඛක්ඛන්ධය නැතිවෙන විදියයි දෙකම බුදුරජාණන්වහන්සේ අවබෝධ කරගෙන තමයි අවසානයේදී **"අනෙකජාතිසංසාරං, සන්ධාවිස්සං අනිබ්බිසං"** කියන ගාථාව ප්‍රකාශ කරන්නේ.

මෙන්න මේ කාරණය තේරුම් ගන්න. පටිච්චසමුප්පාදයේ පළවෙනි කොටසේ අවසානයේ තිබෙනවා **"එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති"** කියලා වාක්‍යය කාණ්ඩයක්. මේක හොඳට පාඩම් කරගන්න. මේකේ තේරුම 'මේ මුළු දුක්ඛස්කන්ධයාගේම හටගැනීම වෙයි' කියන එකයි. ඒ දුක්ඛස්කන්ධයාගේ හට ගැනීම **'අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙව දුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති'** යනුවෙන් දේශනා කරලා තිබෙනවා. **සම්භවන්ති** කියලා කියන්නේ හට ගන්නවා, ඇතිවෙනවා කියන එකයි. ඊට පස්සේ තමයි **"එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති"** කියලා තිබෙන්නේ. මේ කිව්වේ දුක්ඛස්ඛන්ධයේ හටගැනීමයි.

දෙවෙනි කොටසේ අවසානයේ තිබෙනවා **"එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති"** කියලා.

අපි දැන් මේ දුක්ඛස්කන්ධයේ හට ගැනීමේ පුරුක්, ඒවා හට ගන්න හන්දි කථා කරමින් එන්නේ. මේ දවස්වල අපි කථා කරන්නේ විඤ්ඤාණය නිසා නාම රූප ඇතිවෙන්නේ කොහොමද කියලා. ඊයේ අවසන් කරනකොට මේ පින්වතුන්ට කියලා දුන්නා ප්‍රතිසන්ධි විඤ්ඤාණය හට ගන්නා අවස්ථාවේදී හට ගන්නා නාම ධර්ම සහ රූප ධර්ම ගැන. අපි කිව්වා රූප කලාප තුනක් හටගන්නා විදිය. කෙනෙක් මවු කුසක පිළිසිඳ ගන්නවා කියලා කියන්නේ විඤ්ඤාණයක් කොහේ හරි තැනකින් අයින්වෙලා මවුකුසේ හට ගැනීමට පත්වෙනවා කියන එකයි. ඒ විඤ්ඤාණය ඉස්සෙල්ලාම හටගන්නවා නොවෙයි, වෙන කොහේ හරි තැනකින් ගැලවිලා ආපු එකක් තමයි එතැන රැඳෙන්නේ. ඒක රැඳෙන්නේ විපාකයක් හැටියටයි. මේ අවස්ථාවේදී ප්‍රතිසන්ධි විඤ්ඤාණය විතරක් නොවෙයි හටගන්නේ. ඒකේ තිබෙනවා තවත් ධර්මතා කීපයක්. ඒ තමයි නාම ධර්ම ටිකකුයි රූප ධර්ම ටිකකුයි. ඒවත් එකතු වෙනවා, ප්‍රතිසන්ධි වශයෙන්.

දැන් අපි බලමු යම් කිසි මවු කුසක විඤ්ඤාණයක් හටගන්නේ කොහොමද කියලා.

විපාකයක් හැටියට හට ගන්නා විඤ්ඤාණය ආශ්‍රිතව තිබෙනවා **වේදනාව සංඥාව** සහ **සංඛාර**. ඒ සමගම පහළ වෙනවා **කාය දසකය - භාව දසකය - වත්ථු දසකය** යන රූප ධර්ම **තුන**.



මේ නාම ධර්ම සහ රූප ධර්ම සියල්ල පහළ වන්නේ එකම අවස්ථාවකදීය.

**කාය දසකය**

1. පඨවි
2. ආපෝ
3. තේජෝ
4. වායෝ
5. වර්ණ
6. ගන්ධ
7. රස
8. ඕජා
9. ජීවිත ඉන්ද්‍රිය
10. කාය ප්‍රසාද රූපය

**භාව දසකය**

1. පඨවි
2. ආපෝ
3. තේජෝ
4. වායෝ
5. වර්ණ
6. ගන්ධ
7. රස
8. ඕජා
9. ජීවිත ඉන්ද්‍රිය
10. භාව රූපය

**වත්ථු දසකය**

1. පඨවි
2. ආපෝ
3. තේජෝ
4. වායෝ
5. වර්ණ
6. ගන්ධ
7. රස
8. ඕජා
9. ජීවිත ඉන්ද්‍රිය
10. වත්ථු රූපය

සමහර වෙලාවට මේ රූප වලට දසක කලාප කියලා කියන්නේ නැතුව අපි කියනවා මවුකුසේ කළල රූපයක් පහළ වෙනවා කියලා. කළල රූපය කියලා කියනකොට අපි ගන්නේ **කාය රූපයයි – භාව රූපයයි – වත්ථු රූපයයි** තුනම එකට කරලා.




කළල රූපය (කාය රූපයයි - භාව රූපයයි - වත්ථු රූපයයි තුනම එකට එකතු කරලා අපි කියනවා කළල රූපය කියලා )

තවත් සමහර වෙලාවට කියනවා 'උපදින වෙලාවේදී රූප තුනක් පහළ වෙනවා' කියලා. ඒ තමයි කාය රූපය - භාව රූපය - වත්ථු රූපය. කාය රූපය - භාව රූපය - වත්ථු රූපය කියන කථාව කියන්නේ 'කලාප' කියන කථාවක් කරන්නේ නැතුව. නමුත් අපි දැනගන්න ඕනෑ දසක කලාපයක තමයි ඕක තිබෙන්නේ කියලා. එක එක දේශනා ක්‍රම අනුව වචන භාවිතා කිරීම වෙනස් වෙනවා. සමහර දේශනා කෙටියෙන් කරනවා. සමහර දේශනා in detail කරනවා. දැන් මේ කරන්නේ detail විග්‍රයක්.

මේ විදියට මවුකුසක කෙනෙක් උපදිනකොට තනි රූප (individual රූප) තිබෙනවා 30 ක් = (කලාප 3 X 10) සහ නාම ධර්ම 3 ක් තිබෙනවා. එතකොට ඔක්කොම රූප තිබෙනවා 30 + 3 =33 ක්. නමුත් මේ ටිකෙන් පමණක් ජීවිතයක් ගෙනියන්න බෑ. කථා කරන්න ලෝකය දකින්න බෑ.

ඊළඟට කළල රූපය වැඩිලා වැඩිලා යනවා. මේ වැඩීම එක එක සත්වයන්ගේ හැටියට වෙනස් වෙනවා. මනුස්සයන්ගේ හැටියට බල්ලෝ බළල්ලුන්ගේ හැටියට හරකුන් ආදී අනිත් තිරිසන් ගත සතුන්ගේ හැටියට මෙය වෙනස් වෙනවා.

මවු කුසක සත්වයෙක් පහළ වෙනකොට ඒ ප්‍රතිසන්ධි විඤ්ඤාණයේ තිබෙනවා වේදනා සංඥා සංඛාර කියන නාම ධර්ම ටිකත් කාය දසක - භාව දසක - වත්ථු දසක කියන රූප කලාප පහළ කරන්නටත් අවශ්‍ය හේතු. ඒක නිසා තමයි ඒවා පහළ උනේ.

සත්වයෙක් උපදිනවා කියන එකයි මාතෘ පරිසරය කියන එකයි දෙකක්. මේ අවස්ථාවේදී මවගේ කුසේ පුරුෂ ලෙයින් හැදිච්ච කොටසකුත් තිබෙන්න ඕනෑ. මවුගේ ලෙයින් හැදිච්ච කොටසකුත් තිබෙන්න ඕනෑ. ශුක්‍රානු තිබෙන්න ඕනෑ. ඩිම්බයක් තිබෙන්න ඕනෑ. ඒ දෙක යම්කිසි අවස්ථාවක එකතුවෙලා යුක්තානුවක් හැදෙනවා. මේ තමයි සාමාන්‍යයෙන් ලෝකයට විද්‍යාවෙන් උගන්වන විදිය. විඤ්ඤාණයක් බැස ගැනීමට නම් යුක්තානුවක් තිබිය යුතුයි. මේ යුක්තානුව හැදුන අවස්ථාවේම තමයි විඤ්ඤාණයක් බැස ගත යුත්තේ. ලෝකයේ විඤ්ඤාණ කෝටි ගානක් හැසිරෙනවා, නමුත් සුදුසු කර්ම ශක්තියක් තිබෙන විඤ්ඤාණයක් එම යුක්තානුවට බැස ගන්නවා.

මේ විඤ්ඤාණය තවත් කෙනෙකුගේ ශරීරයක තිබෙන යුක්තානුවකට බැස ගත්තත් ඒ විඤ්ඤාණයේ තිබෙනවා බලවත් කර්ම ශක්තියක්, යුක්තානුව පාවිච්චි කරලා ඒක ආශ්‍රය කරමින් නාම ධර්ම සහ රූප ධර්ම හදන්න. මවුගේ කුසේ තිබෙන යුක්තානුව පාවිච්චි කරලා ඇස් කන් නාසය ආදිය එයාගේ කර්ම ශක්තියෙන් එයා හදා ගන්නවා.

තවත් සමහර අවස්ථාවලදී යුක්තානු හැදිලා සත්වයෝ ඇවිල්ලා එහෙම්ම නැතිවෙලා විනාස වෙලා යනවා. අම්ම දන්නෙත් නෑ, තාත්තා දන්නෙත් නෑ. යුක්තානුවක් හැදුන මාත්‍රයෙන්ම යුක්තානුවට හයියක් නෑ ඇස් කන් නාස හදන්න. ඒකෙන් ලැබෙන්නේ ඇස් කන් නාස හදන්න පරිසර මාත්‍රය පමණයි. යුක්තානුවකට විඤ්ඤාණයක් ආවහම එයාගේ කර්ම ශක්තියේ හැටියට ඇස් කන් නාස ආදිය හදාගන්න පරිසරයක් තිබෙනවා.

අපි මෙහෙම හිතමු. පිටි වලින් පාන් හැදෙන්නේ නෑ. හැබැයි ඒ පිටි ටික දාලා ඒක අනලා යීස්ට් දාලා හැඩගස්සලා පාන් ගෙඩියක් හදන්නේ වෙන කෙනෙක්. ඇත්තටම පාන් ගෙඩිය හැදෙන්නේ පිටි නිසාම නොවෙයි. වෙන කෙනෙක් ඇවිල්ලා එයාගේ තිබෙන්නා වූ skill එකෙන්, එයාගේ තිබෙන්නා වූ knowledge එකෙන් තමයි ඒ පිටි ටික ලස්සනට shape වෙලා හැඩ ගැහිලා එන්නේ. පිටි තිබුණාම කියලා පාන් හැදෙන්නේ නෑ. ඒවගේ මවු කුසක ඒ පරිසරය තිබුණාටම මදි. එතැනට වෙනමම කර්ම ශක්තියක් එන්න ඕනෑ. කර්ම ශක්තියේ තමයි ඒක form කරන ගතිය තිබෙන්නේ. දැන් අපි හිතමු අවුරුද්දට කැවුම් හදනවා. කැවුම් හදනකොට සීනිත් තිබෙනවා පැණිත් තිබෙනවා පිටිත් තිබෙනවා. ඒ ටික ඔක්කෝම මිශ්‍ර කරලා ඊට පස්සේ තෙල් තාච්චියට දාල හැඩ වැඩ කරලා කැවුම් හදන skill එක තිබෙන්නේ පිටි වලත් නොවෙයි හැන්දෙත් නොවෙයි තෙල්වලත් නොවෙයි තාච්චියෙත් නොවෙයි, ඒක තිබෙන්නේ කැවුම් හදන කෙනා ළඟ. එයාගේ skill එක තමයි කැවුම් හදනකොට ඒකට ආදේශ වෙන්නේ. ඒවගේම මවු කුසේ රූප තිබුණාටම බෑ, කර්ම ශක්තියක් තිබෙන්න ඕනෑ. සමහර වෙලාවට දක්ෂතාවයක් නැති කෙනෙක් කැවුම් හැදුවහම ඒක ලස්සනට හැදෙන්නේ නෑ. ඒවා අඩුපාඩු සහිතයි. ඒවගේම මවු කුසට බැස ගන්නා විඤ්ඤාණය අඩුපාඩු සහිතයි නම් කර්ම ශක්තිය හයිය

නැත්නම් ඒක බලවත් කර්මයක් සහිත විඤ්ඤාණයක් නොවෙයි නම් ඒ හැදෙන රූපය අඩුපාඩු සහිතයි. සමහර විට ඇස් පේන්නේ නෑ කන් ඇහෙන්න නෑ.

තවත් තිබෙනවා මෙහෙම දෙයක්. කොපමණ කාන්තාවන් හිටියත් කොපමණ පිරිමින් හිටියත් ඒ අයට ඕනෑ විදියට ළමයි හැදෙන්නේ නෑ. සමහර ළමයින්ගේ හැඩරුව මවු පැත්තට බරයි. සමහර අය තාත්තාගේ පැත්තට බරයි. නමුත් සමහර වෙලාවට එයා අම්මා වගේත් නොවෙයි තාත්තා වගේත් නොවෙයි. ආච්චි සීයා වගේත් නොවෙයි. ඒ අය සම්පූර්ණයෙන්ම වෙනස්. එහෙම සම්පූර්ණයෙන්ම වෙනස් අය ඉන්නේ ඒ අය කරලා තිබෙන කර්ම ශක්තියට අනුව හැදෙන විඤ්ඤාණයට මවුකුස landing point එකක් විතරයි. එයා අනිත් ඔක්කෝම ටික, ඇස් කන් නාසය වර්ණය ආදී සියලුම දේ එනකොට අරගෙන ඇවිල්ලා තිබෙනවා. ඒක නිසා එයා අම්මා වගේත් නොවෙයි, තාත්තා වගේත් නොවෙයි සීයා ආච්චි වගේත් නොවෙයි. ඒ පරම්පරාවේ කිසිම කෙනෙක් වගේ නොවෙයි. ඔන්න ඔහොම ශක්තියක් ඒ විඤ්ඤාණයට තිබෙනවා.

ඊළඟට ප්‍රතිසන්ධියෙන් පසුව ටික කාලයකින් සති කීපයකින් මේ කළලයට පහත සඳහන් දසක කලාප **හතර** එකතු වෙනවා.

| චක්ඛු දසකය | සෝත දසකය | ඝාණ දසකය | ජිව්හා දසකය |
|---|---|---|---|
| 1. පඨවි | 1. පඨවි | 1. පඨවි | 1. පඨවි |
| 2. ආපෝ | 2. ආපෝ | 2. ආපෝ | 2. ආපෝ |
| 3. තේජෝ | 3. තේජෝ | 3. තේජෝ | 3. තේජෝ |
| 4. වායෝ | 4. වායෝ | 4. වායෝ | 4. වායෝ |
| 5. වර්ණ | 5. වර්ණ | 5. වර්ණ | 5. වර්ණ |
| 6. ගන්ධ | 6. ගන්ධ | 6. ගන්ධ | 6. ගන්ධ |
| 7. රස | 7. රස | 7.රස | 7. රස |
| 8. ඕජා | 8. ඕජා | 8.ඕජා | 8. ඕජා |
| 9. ජීවිත ඉන්ද්‍රිය | 9. ජීවිත ඉන්ද්‍රිය | 9. ජීවිත ඉන්ද්‍රිය | 9.ජීවිත ඉන්ද්‍රිය |
| 10. චක්ඛු ප්‍රසාද රූපය | 10. සෝත ප්‍රසාද රූපය | 10. ඝාණ ප්‍රසාද රූපය | 10. ජිව්හා ප්‍රසාද රූපය |

ප්‍රතිසන්ධි අවස්ථාවේදී පහළ වෙනවා ‘**කාය දසකය**’ ‘**භාව දසකය**’ සහ ‘**වත්ථු දසකය**’. ඊට සති කීපයකට පසු පහළ වෙනවා ‘**චක්ඛු දසකය**’ ‘**සෝත දසකය**’ ‘**ඝාණ දසකය**’ සහ ‘**ජිව්හා දසකය**’. මෙතැන කලාප වශයෙන් 7 ක් තිබෙනවා. සම්පූර්ණයෙන් මනුස්සයෙක් හැදෙන්න මේ සියල්ල තිබිය යුතුයි.

සමහර අවස්ථාවලදී සමහර අයට උපතේදීම **කාය දසක** - **භාව දසක** - **වත්ථු දසක** ලැබුණාට පසුව ඇතිවෙන **චක්ඛු දසක** - **සෝත දසක** - **ඝාණ දසක** - **ජිව්හා දසක** ආදී දසක කලාප වලින් එකක් අඩුවෙන් හට ගන්නවා. ඒකට හේතුව පෙර කරන ලද කර්මයක විපාකයක් වශයෙන් එහි හටගැනීම block කරලා තිබෙනවා. ඒක නිසා සමහර අය උපතින්ම අන්ධයි. සමහර අය උපතින්ම බිහිරියි. මේ විදියටයි මනුස්සලෝකයේ වැඩ සිද්ධ වෙන්නේ.

මේ දසක කලාප සියල්ලම රූප. මේ පසුව ඇතිවෙන රූප උනත් හට ගන්නේ ප්‍රතිසන්ධි වශයෙන් විඤ්ඤාණයක් හට ගත්ත නිසයි. ඒක නිසා කියනවා **විඤ්ඤාණ පච්චයා නාමරූපං** කියලා.

මේ දසක කලාප 7 සම්පූර්ණවීමත් සමග තනි රූප තිබෙනවා 70ක් = (10 X 7 = 70) . නාම ධර්ම 3 යි = (වේදනා සංඥා සංඛාර). සියල්ල 70 + 3 = 73

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස ඔය රූප 70 තිබෙන පඨවි එකම පඨවියක් හැටියට ගන්නවද?

<u>පිළිතුර</u> - නෑ, හැත්තෑව තුල තිබෙන පඨවි ධාතුව 'ගුණ' වශයෙන් එකයි. නමුත් ඒ පඨවි ධාතුව වැඩ කරන තැන හැටියට වෙනස්.

දැන් මෙහෙම හිතන්න. අපි පරිප්පු කරියකුයි කැරට් කරියකුයි බෝංචි කරියකුයි අල කරියකුයි හදනවා. එතකොට ඒ හැම එකකටම අපි ලුණු දානවා, තුනපහ දානවා. එතකොට ඒ කැරට් එකට දාපු ලුණු තුනපහ අදාළ වෙන්නේ කැරට් වලටයි. ඒක අල එකට අදාළ වෙන්නේ නෑ. අල එකට දාපු ලුණු තුනපහ නියෝජනය කරන්නේ උදව් කරන්නේ අල කරියට. දෙකේම තිබෙන්නේ ලුණු උනාට උදව් කිරීම් වශයෙන් වෙනස්.

ඒවගේ කලාප හැම එකකම තිබෙන්නේ පඨවි උනාට නියෝජනය වෙන්නේ වෙන් වෙන් වශයෙන්. කනයි ඇසයි එක ළඟ පිහිටලා තිබුණාට කනේ තිබෙන පඨවි ආපෝ තේජෝ ආදී ධාතු තිබෙන්නේ එතැන තිබෙන්නාවූ සෝත ප්‍රසාදයට support කරන්න මිසක චක්ඛු ප්‍රසාදයට support කරන්න නොවෙයි.

දැන් ඇස ගත්තහම චක්ඛු ප්‍රසාදයයි කාය ප්‍රසාදයයි දෙකම එක තැන තිබෙන්නේ. එහෙම එක තැන තිබුණාට කාය ප්‍රසාදයට තිබෙන්නා වූ පඨවි ආපෝ තේජෝ වායෝ ටික එතැනට උදව් කරනවා. චක්ඛු ප්‍රසාදයට අයිති පඨවි ආපෝ තේජෝ වායෝ චක්ඛු ප්‍රසාදයට උදව් කරනවා. ඔය විදියටයි තිබෙන්නේ.

අපි ඊයේ කිව්වා නපුංසක සත්වයෙක් උපදිනවා කියලා. එයාට **භාව රූපය** පිහිටන්නේ **නෑ**. ඒක නිසා උපදින අවස්ථාවේදී එයාට තිබෙන්නේ දසක කලාප 2යි. **කාය දසකය** සහ **වත්ථු දසකය** පමණයි. නමුත් ඊට පස්සේ කාලයකදී එයාට **චක්ඛු ප්‍රසාදය - සෝත ප්‍රසාදය - ඝාණ ප්‍රසාදය - ජිව්හා ප්‍රසාදය** යන හතරම පහළ වෙනවා. ඒක නිසා මෙයාට ඇතිවෙන්නේ දසක කලාප හයයි (06).

මේ අනුව හොඳම හොඳ විපාක විඤ්ඤාණයක් හදන්න නම් කරන්න තිබෙන්නේ හොඳ අවබෝධයෙන් ඥාන සම්ප්‍රයුක්තව කුසල කර්ම කරන්න ඕනෑ. පරමාර්ථ වශයෙන් ගත්තහම ඒකත් දුකයි නමුත් මේ සිද්ධියට අදාළව ගත්තහම රූප කලාප හොඳ වෙන්න නම් ප්‍රතිසන්ධි විඤ්ඤාණය හොඳ වෙන්න ඕනෑ.

දැන් මේ අපි කියන්නේ **'විඤ්ඤාණ පච්චයා නාමරූපං'** කියන කථාව.

අපි ඊළඟට බලමු රූපාවචර බ්‍රහමලෝකයේ උප්පත්තිය ගැන. කෙනෙක් හොඳට භාවනා කරලා ධ්‍යාන උපදවා ගන්නවා. ධ්‍යාන සිත් කියලා කියන්නේ ඉතාමත් වටිනා බල සම්පන්න කුසල් සිත්. ඒ සිත් වල ආනුභාවයෙන් එයා උපදිනවා බ්‍රහ්මලෝකයේ.

බ්‍රහ්මලෝකවල උප්පත්තිය ඕපපාතිකයි. එතකොට පහළ වෙනවා - විඤ්ඤාණ පච්චයා නාමරූපං.

1. වත්ථු රූපය = රූප 10
2. චක්ඛු රූපය = රූප 10
3. සෝත ප්‍රසාදය = රූප 10
4. ජීවිත නවකය = රූප 09

39

සහ

1. වේදනා
2. සංඥා
3. සංඛාර යන නාම ධර්ම 3

බ්‍රහ්මලෝකයේ පහළ වෙන රූප ධර්ම සහ නාම ධර්ම සියල්ල 39 + 3 +42

බ්‍රහ්මයන්ට කාය ප්‍රසාදය පිහිටන්නේ නෑ. ඒක නිසා කයට දැනීමක් ඇතිවෙන්නේ නෑ. හිත පිහිටන්න ඕනෑ නිසා වත්ථු රූපය පිහිටනවා. බලන්න ඕනෑ නිසා ඇස් තිබෙනවා. අහන්න ඕනෑ නිසා සෝත තිබෙනවා. ජීවිතිය පවත්වන්න ඕනෑ නිසා ජීවිත නවකය තිබෙනවා. **වේදනා - සංඥා - සංඛාර** කියන නාම ධර්ම තුනත් තිබෙනවා. එතකොට නාම සහ රූප ධර්ම සියල්ල 42 වෙනවා. මේ තමයි ඕපපාතිකව රූපාවචර බ්‍රහ්මලෝකයේ උපදින කෙනෙකුට ලැබෙන ධර්ම.

ඊළඟට බලමු අරූපාවචර බ්‍රහ්මලෝකයේ උප්පත්තිය. මෙහි තිබෙන්නේ **විඤ්ඤාණ පච්චයා නාම** පමණයි. අරූපාවචර බ්‍රහ්මලෝකයේ රූප නෑ. එහි හටගන්නේ **වේදනා -සංඥා - සංඛාර** කියන නාම ධර්ම තුන පමණයි.

ප්‍රශ්නය - ස්වාමීන් වහන්ස දෙවියන්ට සියුම් කයක් තියෙනවද?

පිළිතුර - තිබෙනවා. දෙවියන්ට අපිට වගේ ඔක්කෝම රූප තිබෙනවා. නමුත් මනුස්සලෝකයේදි රූප පහළ වීම සිදු වන්නේ කොටස් දෙකකට. ප්‍රතිසන්ධි අවස්ථාවේදී කාය දසකයත් භාව දසකයත් වත්ථු දසකයත් පහළ වෙනවා. සති කීපයකට පසු චක්ඛු ප්‍රසාද - සෝත ප්‍රසාද - ඝාණ ප්‍රසාද - ජිව්හා ප්‍රසාද යන රූප පහළ වෙනවා. නමුත් දිව්‍යලෝකයේ කෙනෙක් පහළ වෙනකොට මේ සියලුම රූප එනම් දසක කලාප හතම ඕපපාතිකව උපදින වෙලාවේදීම පහළ වෙනවා.

ප්‍රශ්නය - ඕනෑම තැනක පහළ වෙන්න පුළුවන්ද?

පිළිතුර - අපිට තර්කානුකූලව කියන්න පුළුවන් ඕනෑම තැනක පහළ වෙනවා කියලා. කිසිම දවසක දෙවි කෙනෙක් අප්‍රසන්න තැනක නරක තැනක පහළ වෙන්නේ නෑ. එයාට විමානයක් පහළ වෙනවා උනත් හොඳ ලස්සන මල් තිබෙන සුවඳවත් ගහක වෘක්ෂ දේවතාවෙක් වගේ වෙන්න පුළුවන්.

එක එක බලවත් දෙවිවරු ඉන්නවා. දිව්‍යලෝකවල උප්පත්තිය ගැන කියන්න ගියහම සමහර උප්පත්ති හරි පැහැදිලියි පිරිසිදුයි. නමුත් සමහර වෙලාවට තව කෙනෙකුට අයිති වෙලා උපදිනවා. සමහර දෙවි දේවතාවන්ට පුණ්‍යකර්ම නිසා ඒ ගොල්ලන්ට පහළ වෙනවා ලොකු විමාන. ඒ දෙවිවරු මාහානුභාව සම්පන්නයි. ඕනෑම තැනකට යන්න එන්න ශක්තිය තිබෙනවා. යමක් ප්‍රකාශ කරන්න හයිය තිබෙනවා. නමුත් සමහර අය තවත් කෙනෙකුට යටත්ව තමයි පහළ වෙන්නේ.

අපි මෙහෙම හිතමු. විසාල අකාස ධාතුවක් තිබෙනවා. සමහර වෙලාවට මගේ විමානය පහළ වෙනවා ලස්සන තැනක. එතකොට කාටවත් අතගහන්න බෑ. එතකොට මම කාටවත් යටත් නැති නමුත් දිව්‍ය සමාජයට අයිති කෙනෙක්. සමහර වෙලාවට අපි පිංකමක් කළහම ශක්‍ර දේවේන්ද්‍රයාගේ මිදුලේ පහළ වෙනවා. එහෙම උනහම එයා පහළ වෙලා තිබෙන්නේ කාටහරි යටත්වයි. ඒ අය බොහෝ විට අල්පේශාක්‍යයි. ඊට පස්සේ ශක්‍ර දේවේන්ද්‍රයා මොකක් හරි duty එකකට එයා යොමුකරනවා. එහෙම උනහම ඒ ප්‍රධාන දේවතාවාගෙන් අවසරයක් නැතුව එයාට කොහේවත් යන්න බෑ.

දෙවියක් අතර දක්ෂ ඉතාමත් පින්කරපු අයත් ඉන්නවා. සටකපට අයත් ඉන්නවා. දෙවියන්ගේ ස්වභාවය දැන ගන්න සංයුත්ත නිකායේ දේවතා සංයුත්තය කියවන්න ඕනෑ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස රූපාවචර බ්‍රහ්මලෝකයේ රූප ධර්ම සහ නාම ධර්ම සියල්ල 42 කියලා කිව්වා. එතකොට ඒ නාම ධර්ම තුනේ වේදනාව තිබෙනවා. එතකොට ඔබහන්සේ කිව්වා බ්‍රහ්ම කයට වේදනාව දැනේන්නේ නෑ කියලා.

| | | | |
|---|---|---|---|
| 1. වත්ථු රූපය | = රූප 10 | | 1. වේදනා |
| 2. චක්ඛු රූපය | = රූප 10 | සහ | 2. සංඥා |
| 3. සෝත ප්‍රසාදය | = රූප 10 | | 3. සංඛාර යන නාම ධර්ම <u>3</u> |
| 4. ජීවිත නවකය | = රූප <u>09</u> | | |
| | <u>39</u> | | |

බ්‍රහ්මලෝකයේ පහළ වෙන රූප ධර්ම සහ නාම ධර්ම සියල්ල 39 + 3 +42

<u>පිළිතුර</u> - ඔව් වේදනාව තිබෙනවා. ඒ වේදනාව තිබෙන්නේ ඒ බ්‍රහ්මයාට මනෝ ධර්ම සම්බන්ධයෙන් පමණයි. ඒ කියන්නේ මානසික වින්දනය තිබෙනවා. නමුත් කායික වේදනාව නෑ. දැන් අපේ නම් ඇඟැත් රිදෙනවා කනත් රිදෙනවා. නමුත් ඒ ගොල්ලන්ට එහෙම නෑ.

<u>ප්‍රශ්නය</u> - මානසික වේදනාව කිව්වහම ස්වාමීන්වහන්ස anxiety එන්නත් පුලුවන්ද?

<u>පිළිතුර</u> - නෑ anxiety එන්නේ නෑ. ඒ ගොල්ලෝ බොහොම සැපෙන් ඉන්නේ. Anxiety එන්නේ ද්වේශය නිසා. ඒ කියන්නේ අනපේක්ෂිත බලාපොරොත්තු, ඒක නිසා ද්වේශය. ඒ අයට එහෙම වෙන්නේ නැත්තේ බ්‍රහ්මයා කියන කෙනා කරපු හොඳ දේවල් නිසා හරිම සතුටින් ඉන්නේ ඒ අය. අනිත් එක තමයි බ්‍රහ්මයෙක් මැරිලා ගිහිල්ලා අපායේ ඉපදෙන්නෙත් නෑ.

ඊළඟට අපි බලමු **අසඤ්ඤතලයේ** උප්පත්තිය.

කෙනෙක් මනුස්සලෝකයේ භාවනා කරනවා. මේ කෙනා නාම ධර්මයන්ට විරුද්ධයි. හිතත් එක්ක විරුද්ධයි. එයා හිතට කැමති නෑ. හේතුව, 'හිත තිබෙන නිසා තමයි මේ ඔක්කෝම කරදර, රූපයේ කිසිම කරදයක් නෑ' කියලා එයා රූපය එපා කියලා කියන්නේ නැතුව 'වේදනා සංඥා එපා මට හිතත් එපා' කියලා භාවනා කරලා මැරිලා යනවා. මැරිලා

ගිහිල්ලා මොකක් හරි විදියකට අසඤ්ඤතලයේ එයාට රූප ස්වභාවයක් පහළ වෙනවා. ඒක වලාකුළක් වගේ වෙන්නත් පුළුවන්, ඒවගේ මොකක් හරි සියුම් රූපයක් පහළ වෙනවා. ඒ රූපයට **හිතක් නෑ**. එතකොට එතන තිබෙන්නේ ජීවිත නවකය පමණයි.




අසඤ්ඤතලයේ පහළ වෙන මෙම රූපය මොන වගේද කියන්න බෑ. ඒක වලාකුළක්වගෙත් වියහැකියි. එහි තිබෙන්නේ **ජීවිත නවකය** පමණයි.

**ජීවිත නවකය** = පඨවි + ආපෝ + තේජෝ + වායෝ + වර්ණ + ගන්ධ + රස + ඕජා + ජීවිත ඉන්ද්‍රිය = 09

මේ රූපය නිකං වලාකුළක් වගේ තිබෙනවා. ඒකට හිතකුත් නෑ. දැනෙන්නෙත් නෑ. පුච්චන්නත් බෑ. නැතිවෙන්නෙත් නෑ. එයාගේ කර්ම ශක්තිය ඉවරවෙනකම් එහෙම්ම තිබිලා නැතිවෙලා යනවා.

ප්‍රශ්නය - එතකොට ස්වාමීන්වහන්ස එයා එතැනින් චුත වෙනකොට ප්‍රතිසන්ධිය වෙන්නේ?

පිළිතුර - ඒ රූපය නැතිවෙලා යනවා. ඊට පෙර භවයේ නවත්වපු හිතට හා සමාන හිතකින් නැවතත් ප්‍රතිසන්ධිය පටන් ගන්නවා.

ඔය විදියටයි **විඤ්ඤාණපච්චයා නාමරූපං** කියන කථාව ඇතිවෙන්නේ.

ඊළඟට තවත් එකක් කියලා දෙන්නම්.

මවුකුසක පහළ වන කාය - භාව - වත්ථු - චක්ඛු - සෝත - ඝාණ - ජිව්හා යන රූප සියල්ලම කර්මයෙන් හැදුනු කර්මජ රූප. මේ කර්මජ රූප පහළ උනාට හුදකලාවම මේ කර්මජ රූප වලින්ම ඉන්න ඕනෑ කියලා එහෙම ඉන්න බෑ. ඒක නිසා මේ කර්මජ රූප වලට අනිත් අයගේ උදව්ව තිබෙන්න ඕනෑ.

ඒ තමයි **චිත්තජ - ඍතුජ - ආහාරාජ** රූප පහළ වෙන්න ඕනෑ.

ඉස්සරවෙලාම පටන් ගැනීමේදී මවුකුසේ කර්මජ රූප පහළ වෙලා ඊට පස්සේ ඍතුජ රූප පහළ වෙලා ඊට පස්සේ චිත්තජ රූප පහළ වෙලා ඊට පස්සේ මවගෙන් ආහාර එක්කාසු වෙන්න කොයි යම් මොහොතක පටන් ගත්තද එතකොට තමයි ආහාරාජ රූප එක්කාසු වෙන්නේ.

මේ අනුව ඉස්සෙල්ලාම පහළ වෙන්නේ කර්මජ රූප. දෙවෙනුව පහළ වෙන්නේ ඍතුජ රූප. තුන්වෙනුවට පහළ වෙන්නේ චිත්තජ රූප. අවසානයට පහළ වෙන්නේ ආහාරාජ රූප.

චිත්තජ - ඍතුජ - ආහාරාජ රූප පහළ වෙලා මුලින් පහළ වූ කර්මජ රූපයන්ට උදව් කරනවා. මේ රූප වලින් උපස්ථම්භනය ලැබුවට පස්සේ තමයි කර්මජ රූප ටිකට අවුරුද්දක්ද දෙකක්ද තුනක්ද දහයක්ද සීයක්ද කොපමණ හෝ කාලයක් යන්න පුළුවන් කම තිබෙන්නේ.

ඒවගේම තමයි චිත්තජ - ඍතුජ - ආහාරාජ රූප වලටත් කර්මජ රූප නැතුව ඉන්න බෑ. කර්මජ රූප වලට උදව් කර කර චිත්තජ - ඍතුජ - ආහාරාජ රූපත් පවතිනවා.

ඉතින් අපේ ශරීරය තුල **කර්මජ රූප** තිබෙනවා **චිත්තජ රූප** තිබෙනවා **ඍතුජ රූප** තිබෙනවා **ආහාරජ රූප** තිබෙනවා. වර්ග හතරක රූප තිබෙනවා. ඒවා තමයි මේ පවතින්නේ. සමහර වෙලාවට ආහාරජ රූප අඩු වෙනවා.එතකොට බඩ ගිනි වෙනවා, පණ නැතිවෙනවා. එතකොට නැවතත් ඕජාව ටිකක් දාන්න ඕනෑ. ඒක සමාන්‍යයෙන් කෑම බීම වශයෙන් හෝ තේ කෝපි වශයෙන් හෝ මොන මොනවා හරි වශයෙන් ඒ අවස්ථාවට ගැලපෙන ආහාරජ රූප ටිකක් ඇතුල් කරන්න ඕනෑ. ඍතුජ රූප චිත්තජ රූප වලින්ම දුවන්න බෑ.

**විඤ්ඤාණ පච්චයා නාමරූපං** කියලා කියන්නේ ඔය රූපය හැදෙන විදියයි, අපිට හිතක් පහළ වෙනකොට ඒ හිත නිසා පහළ වන **වේදනාව – සංඥාව – සංඛාර** කියන නාම ධර්ම වලටයි. නාම ධර්ම පහළවනකොට **'විඤ්ඤාණ පච්චයා නාමං'** - රූප පහළ වෙනකොට **'විඤ්ඤාණ පච්චයා රූපං'** නම් වෙනවා.

තවත් එක කාරණයක් කියලා දෙන්න ඕනෑ.

ප්‍රතිසන්ධි විඤ්ඤාණය කියලා කියන්නේ මොන හිතක්ද? විපාක සිතක්. එතකොට භවාංග හිත කියලා කියන්නේ මොකක්ද? විපාක සිතක්. මේ ප්‍රතිසන්ධි විඤ්ඤාණයත් භවාංග සිත් යන ඔක්කොම සිත් විපාක විඤ්ඤාණ.

එතකොට මේ **විපාක විඤ්ඤාණ** අවස්ථාවේදී රූප පහළ වෙනවද? පහළ වෙනවා. විපාක විඤ්ඤාණ නිසා නාම රූප ධර්ම හැදෙනවා. ඒක දැන් පැහැදිලියි.

තව තිබෙනවා **අවිපාක විඤ්ඤාණය** කියලා එකක්. **අවිපාක විඤ්ඤාණය** කියලා කියන්නේ **අභිසංඛරණ විඤ්ඤාණයට**. ඒ කියන්නේ කර්ම හදන අවස්ථාව. එතැනත් තිබෙනවා **විඤ්ඤාණ පච්චයා නාමරූපං** කියලා එකක්.

අපි කර්මයක් කරන වෙලාවේ, අපි උදාහරණයක් හැටියට හිතමු අපි පියවර තබාගෙන ඉස්සරහට යනවා කියලා. ඒක විපාකයක් නොවෙයි. අපි කර්ම විපාකයකින් ඇවිදිනවා නොවෙයි. අපි ඒ යන්නේ දැන් හිතලා. අපි යන්න ඕනෑ කියලා හිතනකොට සහ ඒ යන ගමනේදී අපිට හිතක් අවශ්‍යයි. ඒක හිතින් විතරක්ම කරන්න බෑ. ඒ හිතේ තිබෙනවා ඒ ක්‍රියාව සිද්ධ කරවන ඵස්ස - වේදනා - සංඥා - චේතනා - ඒකග්ගතා - ජීවිත ඉන්ද්‍රිය

- මනසිකාර ඊට පස්සේ වීර්ය ආදී ධර්ම සමූහයක්. එතැන තිබෙනවා නේද **වේදනා සංඥා සංඛාර** කියලා කොටසක්. ආන්න ඒවා විපාක නොවෙයි.

ක්‍රියාවක් කරන අවස්ථාවේදී අභිසංඛරණ ගතිය, ඒ කියන්නේ ක්‍රියාත්මක වීම් ස්වභාවය. ඒකෙත් තිබෙනවා **වේදනා - සංඥා - සංඛාර**. ඒක නිසා මේ අවිපාක විඤ්ඤාණ වලත් තිබෙනවා වේදනා සංඥා සංඛාර. ඒක නිසා එතැනත් තිබෙනවා **'විඤ්ඤාණ පච්චයා නාමරූපං'**. ඒ විඤ්ඤාණය පහළ උනේ නැත්නම් නාම පහළ වෙන්නෙත් නෑ. රූප පහළ වෙන්නෙත් නෑ.

ඒවා අපි මීට කලින් ගොඩක් අවස්ථා වලදී කිව්වා. සෝමනස්ස සහගත සිත් වල ඥාන සම්ප්‍රයුක්ත සිත්වල අසංඛාරික සිත්වල වේදනාව පහළ වෙනවා, සංඛාර පහළ වෙනවා, සංඥාව පහළ වෙනවා. ඒවා තමයි නාම ධර්ම.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස අර ප්‍රතිසන්ධි විඤ්ඤාණයත් සමග රූප කලාප ගොඩවල් තුනක් පහළ වෙනවා. ඒක පැහැදිලියි. ඊළඟට ස්වාමීන්වහන්සේ කිව්වා ඒකේ නාම ධර්මත් තිබෙනවා කියලා වේදනා සංඥා සංඛාර කියලා. නමුත් ඒ ප්‍රතිසන්ධි අවස්ථාවේදී චක්ඛු සෝත ඝාණ ජිව්හා කියන ප්‍රසාද රූප පිහිටලා නෑ. සමාන්‍යයෙන් අපි පිළිගන්නේ චක්ඛු සෝත ඝාණ ජිව්හා ආදී ඉන්ද්‍රිය වලට පස්සේ තමයි ඵස්ස වේදනා සංඥා සංඛාර ඇතිවෙන්නේ කියලා. වේදනා සංඥා සංඛාර චෛතසික ධර්මයන් නිසා ඒවා ප්‍රතිසන්ධි සිතෙත් ඒ එකක්ම උපදින භවාංග සිතෙත් තිබෙනවද? නැත්නම් ඒවා නිපදවීමේ ශක්තිය තිබෙනවද?

<u>පිළිතුර</u> - ප්‍රතිසන්ධි සිතේ වේදනා සංඥා සංඛාර තිබෙනවා.

<u>ප්‍රශ්නය</u> - නමුත් තවම සළායතන පිහිටලා නෑ?

<u>පිළිතුර</u> - සළායතන සම්පූර්ණ වෙලා නෑ. මෙහෙමයි තිබෙන්නේ. දැන් මහත්මයා කියන හැටියට අපිට සංවේදී ස්වභාවයක් ඇතිවෙන්න නම් ඉන්ද්‍රිය ධර්මයෝ පරිපූර්ණව පහළ වෙන්න ඕනෑ. නමුත් එහෙම අවශ්‍ය නෑ. අපිට පසුව පහළ වෙන්නේ ඇසයි කනයි නාසයයි දිවයි. මවුකුසේ ඉන්න කෙනාට ඇස් නැති නිසා ඒවා හැදිලා නැති තාක් කල් පේන්නේ නෑ. කන් හැදිලා නැති තාක් කල් ඇහෙන්නේ නෑ. නාසය හැදිලා නැති තාක් කල් ගඳ සුවඳ දැනෙන්නේ නෑ. දිව හැදිලා නැති තාක් කල් රස දැනෙන්නේ නෑ. ඒ උනත් ඒවා පෙනුනේ නැතුවට ගඳ සුවඳ දැනුනේ නැතුවට රස දැනුනේ නැතුවට ඒ මවුකුසේ ඉපදිච්ච කෙනා හිතින්, මානසික වශයෙන් යම් යම් දේවල් විඳිනවා. මනෝ සම්ඵස්සය තිබෙනවා.

එයාට චක්ඛු සම්ඵස්සය නෑ, හේතුව චක්ඛු ප්‍රසාදය නෑ. ඒවගේම තමයි සෝත ඝාණ ජිව්හා ප්‍රසාද මුකුත් නෑ. ඒ උනාට එයාට කාය ප්‍රසාදය තිබෙනවා. මනෝ සම්ඵස්සයත් තිබෙනවා. සත්වයෙක් මවු කුසට ආවට පස්සේ බොහෝ වෙලාවට එයා භවාංගයට බරව තමයි ඉන්නේ. ඒ කියන්නේ නිද්‍රෝපගතව. ඒ උනත් සමහර අය නිද්‍රෝපගතවෙලා උනත් ඒකෙන් පොඩ්ඩක් අවදි වෙලා 'මට මොකද උනේ' 'මම කොතැනද ඉන්නේ' 'මම මොනවාද කළේ' කියලා හිතනවා, මෙනෙහි කරනවා. එයා මවු කුසකට ඇතුල්වෙලා හිටියට එයාට ඊට ඉස්සෙල්ලා ජීවිතිය ළඟයි. එහෙම ළඟ වෙනකොට එයාට යම් යම්

මතක සටහන් එනවා. ඒවා මනෝසම්ඵස්ස. සමහර වේලාවට දුක් වෙනවා. සමහර වේලාවට සතුටු වෙනවා.

අහේතුක සත්වයෝ

අහේතුක සත්වයෝ  කියලා කිව්වහම ඇස් අන්ධ වෙලා කන් බිහිරි වෙලා කිසිම කෙනෙක් මහණ වෙලා ඉඳලා නෑ. ඒ අය මාර්ග ඵල අවබෝධ කරගෙන නෑ. කිසිම කෙනෙක් ධ්‍යානයක්වත් ලබලා නෑ. හැබැයි සමාන්‍යයෙන් පින්කම් කරනවා. ඒකනිසා බුදුරජාණන් වහන්සේ විනයක් පණවනවා ඇස් පේන්නෙ නැති අය කන් ඇහෙන්නේ නැති අය අඳ ගොළු බිහිරි අය මහණ කරන්න එපා, ඒ අයට  මේ සාසනයෙන්  මාර්ග ඵල ලැබීම් වශයෙන් ප්‍රයෝජන ගන්න බෑ කියලා.  එහෙම එකක් තිබෙනවා.

හොඳයි, සැම දෙනාටම ධර්ම අවබෝධය නිර්වාණ අවබෝධය සිද්ධ වේවා කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා.

සාධු! සාධු! සාධු!



ඉහත සඳහන් ධර්ම දේශනාව අති පූජ්‍ය  හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.